(c) www.sinhalalyrics.com

සොඳුරු දසුන් ඇස තවරා ඇස සනසා ගනිල්ලා
මියුරු බොජුන් දිව රඳවා දිව පිනවා ගනිල්ලා
උදේ හවා දෝත නගා එතෙරට වැඳ පුදල්ලා
කන්ට දෙතොත් බොන්ට දෙතොත් රට උගසට තබල්ලා

වාසි පිලට හුරේ දමා පිලෙන් පිලට යමල්ලා
බීපු මිදේ දිය බොර කර මුහුදට ආවඩල්ලා
දනින් වැටී නලල ඔබා නිලතල අරගනිල්ලා
කල දුටු කල වල ඉහගෙන මඩි තරකර ගනිල්ලා

දෙස බස රැස සුරකින ගරු වියතුනි මෙහෙ වරෙල්ලා
කව් සිළුමිණ අමා වතුර කසල ගොඩට දමල්ලා
සුකිරි බටිල්ලන් එක්කල බයිලා පොලට ඇවිල්ලා
රවිකිඤ්ඤා තාල අනුව කපිරිඤ්ඤා ගයල්ලා

පද රචනය - සුනිල් ආරියරත්න
සංගීතය - රෝහණ වීරසිංහ